# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2160/33 - 2020 ජනවාරි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/1951 (XV)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 143 වන වගන්තිය සමඟ කියවිය යුතු 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද අමරවීර,
ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍ය.

2020 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2020 අංක 01 දරන මෝටර් වාහන (මෝටර් වාහන පරිසීමා කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් තැනැත්තකු විසින් කොළඹ - හංවැල්ල (ඒබී 010) මාර්ගයේ තොටලඟ මංසන්ධියේ සිට කොහිලවත්ත මංසන්ධිය දක්වා වූ මාර්ග කොටසේ ඇතැම් වාහන භාවිතා කිරීම පරිසීමා කරනු ලැබිය යුතු ය.

3. 2 වන නියෝගයෙන් පරිසීමා කරනු ලබන වාහන පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) බහාලුම් ප්‍රවාහනය කරන සියලු වාහන ;

(ආ) බිම් මට්ටමේ සිට මීටර් 3.2ට වැඩි උසක් සහිත වෙනත් වාහන ; සහ

(ඇ) බිම් මට්ටමේ සිට මීටර් 3.2ට වැඩි පැටවුම් උසක් සහිත වාහන.

1A - PG 4853— 517 (2020/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. යම් තැනැත්තකු විසින් 3 වන නියෝගය යටතේ පරිසීමා කරන ලද වාහනයක් පහත දැක්වෙන විකල්ප මාර්ගයක පැදවිය හැකි ය.

(අ) ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය (බී 435) ඔස්සේ ; හෝ

(ආ) කොළඹ - හංවැල්ල මාර්ගයේ (ඒබී 010) අතරමැදි ස්ථානයකට ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග :-

(i) ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ (B435) පැමිණ, කොටිකාවත්ත - කොහිලවත්ත මාර්ගය (B469) ඔස්සේ කොහිලවත්ත - කැළණිමුල්ල - අඹතලේ මාර්ගය (AB010) හරහා ; සහ

(ii) ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ (B435) පැමිණ, අංගොඩ - කැළණිමුල්ල මාර්ගය (B644) ඔස්සේ කැළණිමුල්ල - අඹතලේ මාර්ගය (AB010) හරහා ;

විය යුතු ය.

02 - 251

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.